# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2378/54 – 2024 අප්‍රේල් මස 06 වැනි සෙනසුරාදා – 2024.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2024 අංක 38 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4-3/18/2021/WS/90.
ප්‍රා. ලේ. ගේ යොමු අංකය: 3/2/3/10/281.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' ,
අංක. 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, අත්තනගල්ල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 365/C, කරස්නාගල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කරස්නාගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/ATT/2021/405 හා 2022.09.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' - බලුදංගොල්ල කැලේ - ප්‍රමාණය: හෙක්. 0.0107**

උතුරට: එස්.ඒ. කරුණාරත්න හිමිකම් කියන බලුදංගොල්ල කැලේ; නැගෙනහිරට: මුපි ගම් 4172 හි කැබලි අංක 38 ; දකුණට: මුපි ගම් 4172 හි කැබලි අංක 38, ජී.ඩබ්. අනුලාවතී සහ ජී. ඩබ්. චන්ද්‍රාවතී හිමිකම් කියන බලුදංගොල්ල කැලේ; බටහිරට: ජී. ඩබ්. අනුලාවතී සහ ජී. ඩබ්. චන්ද්‍රාවතී හිමිකම් කියන බලුදංගොල්ල කැලේ, මු.පි 16929 හි කැබලි අංක 20 (හිපි 346249) සහ මුපි ගම් 4146 හි කැබලි අංක 1.

EOG 04-0065

1A – G 041727 – 29 (2024/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 40 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4-3/9/2018/MV/149.
ප්‍රා. ලේ. ගේ යොමු අංකය: DSA/PALU/LND/LOTEL/54.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 මාර්තු මස 04 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' ,
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**–ප්‍රාදේශීය ලේකම්, පලුගස්වැව.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක. 598, මඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාදමන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද ක. සි. අංක 110715 කලාප අංක 03 හි පත්‍ර අංක 2 හා 2021.02.25 දිනැති කැඩැස්තර සිතියමේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අංක 39 - මහදිවුල්වැවහේන - ප්‍රමාණයඃ හෙක්. 0.1176**

උතුරටඃ කැබලි අංක 40,33,32,38 සහ 35; නැගෙනහිරටඃ කැබලි අංක 35, 34, සහ 36; දකුණටඃ කැබලි අංක 41,43 සහ 40; බටහිරටඃ කැබලි අංක 40.

EOG 04-0066